# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1981 අංක 19 දරන ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 මාර්තු මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 මාර්තු මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ: ශත 45 යි

තැපැල් ගාස්තුව: ශත 50 යි

# 1981 අංක 19 දරන ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 මාර්තු මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 78/79.

**ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1981 අංක 19 දරන ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය පනතේ 3 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 164 වන අධිකාරයේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (ඇ), (ඈ), (ඉ), (ඊ) සහ (උ) ඡේද එහි (ඉ), (ඊ), (උ), (ඌ) සහ (එ) ඡේද වශයෙන් නැවත අක්ෂර යෙදීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිවම පහත සඳහන් ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ඇ) පාරිසරික දූෂණය අඩු කිරීම හෝ මූලෝත්පාටනය කිරීම සඳහා ප්‍රතිකර්ම යෙදීමට ක්‍රමෝපායයක් ඇතිකිරීමේ අරමුණ ඇතිව ඒ දූෂණය සමීක්ෂණය කිරීම හා නිරීක්ෂණය කිරීම භාර ගැනීමට හා ඊට හවුල් වීමට ;

(ඈ) තාක්ෂණ විද්‍යාඥණය ලබාදීමේ කටයුතුවල නිරතවීමට සහ ශ්‍රී ලංකා ආණ්ඩුවට හෝ වෙනත් ආයතනවලට තාක්ෂණ විද්‍යාඥණය ලබාදීම හා සම්බන්ධ සේවා සැපයීමට.".

**3.** ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 51 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් තවදුරටත් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) එම මණ්ඩලය—

(අ) එක් එක් සාමාජිකයා විද්‍යාත්මක හෝ කාර්මික ක්ෂේත්‍රයෙහි විශිෂ්ටත්වයක් ලබා ඇති හෝ ආයතනයේ කටයුතුවල යම් අංශයක් සම්බන්ධයෙන් වෙනත් ආකාරයක විශේෂ සුදුසුකම් ලැබූ, එමෙන්ම, අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයන් පස් දෙනකුගෙන් ද ;

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකුගෙන් ද ;

(ඇ) (1) 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකු පනත මඟින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව ;

2—ජ 54772—12,500 (81/03)

(ii) (165 වන අධිකාරය වූ) ලංකා සංවර්ධන මුදල් සංස්ථාව පනත මගින් පිහිටුවනු ලැබූ ලංකා සංවර්ධන මුදල් සංස්ථාව ;

(iii) කර්මාන්ත සංවර්ධන කාර්යය සඳහා මූල්‍ය ආධාර සපයන වෙනත් යම් ණය දෙන ආයතනයක්

යන ආයතන අතුරින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් ආයතනයක ප්‍රධාන විධායක හෝ ඔහුගේ නාමිකය ; සහ

(ඈ) (i) ආයතනය කටයුතු කරනු ලබන්නේ යම් අමාත්‍යාංශයක් යටතේ ද, ඒ අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් තත්කාලයෙහි ධුර දරන තැනැත්තා හෝ ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත් කරනු ලැබිය හැකි ඒ අමාත්‍යාංශයේ එවැනි වෙනත් නිලධරයකු ; සහ

(ii) ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් තත් කාලයේ ධුර දරන තැනැත්තා

යන නිල බලයෙන් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනාගෙන් ද

සමන්විත විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(2) නිල බලයෙන් සාමාජිකයකු නොවන්නා වූ මණ්ඩලයේ සාමාජිකයකු විසින්, ඔහුගේ අත්සන යටතේ වූ ලියවිල්ලක් අමාත්‍යවරයා වෙත යැවීමෙන් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමිකය.

10. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ආකාරයට හා අනුප්‍රමාණ අනුව ආයතනයේ අධ්‍යක්ෂවරයාට හැර, මණ්ඩලයේ අනෙක් සාමාජිකයන්ට ආයතනයේ අරමුදලින් පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

6. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 51 දරන පනතින් ඇතුළත් කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 12අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"පර්යේෂණ සැලසුම් සභාවක් පත් කිරීම.

12අ. (1) ආයතනයේ අධ්‍යක්ෂවරයා, ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන්, පර්යේෂණ ශාඛාවල හා අංශවල ප්‍රධානීන් යන අයගෙන් සහ ආයතනයේ සේවයේ

නියුක්ත නොවන තැනැත්තන් වන, එමෙන්ම එක් එක් සාමාජිකයා විද්‍යාවෙහි, ඉංජිනේරු ශිල්පයෙහි හෝ කාර්මික ශිල්පයෙහි විශිෂ්ටත්වයක් ලබා ඇති හෝ ආයතනයේ කටයුතුවල යම් අංශයක් පිළිබඳව අනන්‍යාකාරයකින් විශේෂ සුදුසුකම් ලබා ඇති වෙනත් තැනැත්තන් හය දෙනකුගෙන් සමන්විත වන්නා වූ ද, පර්යේෂණ සැලසුම් සභාව යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ ද, විද්‍යාත්මක උපදේශක සභාවක් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන කර්තව්‍යයන්ට අදාළ එහි කටයුතුවල සියලු අංශයන් පිළිබඳව උපදෙස් දීම පර්යේෂණ සැලසුම් සභාවේ කර්තව්‍යය වන්නේ ය. එම සභාවේ රැස්වීම් පැවැත්විය යුතු අන්දම හා ආකාරය සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"(4) අධ්‍යක්ෂවරයා හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා සහ ගණකාධිකාරිවරයා විසින්, යම් බැංකුවක ආයතනයේ ගිණුමෙන් ලියන ලද යම් චෙක්පතක් අත්සන් කළ යුතු අතර, ඔවුන් අතුරෙන් කවර හෝ තැනැත්තන් පැමිණ නො සිටියහොත්, මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා බලය දෙනු ලැබුවා වූ ද, බැංකුව විසින් ඒ කාර්යය සඳහා අත්සන ලියා පදිංචි කර ඇත්තා වූ ද, මණ්ඩලයේ සාමාජිකයකු හෝ ආයතනයේ නිලධරයකු වන්නා වූ ද, මණ්ඩලයේ සාමාජිකයකු හෝ ආයතනයේ නිලධරයකු විසින් පැමිණ නොමැති තැනැත්තන් වෙනුවෙන් චෙක්පත අත්සන් කරනු ලැබිය යුතු ය. තවද, අධ්‍යක්ෂවරයා, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා සහ ගණකාධිකාරිවරයා පැමිණ නො සිටියහොත්, මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා බලය දෙනු ලැබුවා වූ ද, එසේ අත්සන් ලියා පදිංචි කර ඇත්තා වූ ද, මණ්ඩලයේ සාමාජිකයන් හෝ නිලධරයන් වන්නා වූ ද, මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු හෝ ආයතනයේ නිලධරයන් දෙදෙනකු විසින් චෙක්පත අත්සන් කරනු ලැබිය යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.